සියලුම මැදිරි නැරඹීමට මහජනතාවට අවස්ථාව....

ලියන ලද්දේ Museum Department
2017 පෙබරවාරි 08 වෙනි බදාදා, 07:54 - අවසන් යාවත්කාලීන කිරීම 2017 පෙබරවාරි 08 වෙනි බදාදා, 08:07



කොළඹ ජාතික කෞතුකාගාරයේ සියලුම මැදිරි නැරඹීමට මහජනතාවට අවස්ථාව

රුපියල් මිලියන 200 ක වියදමින් සංරක්ෂණය කරන ලද කොළඹ ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ල 2017 පෙබරවාරි මස 06 වන දින පෙරවරු 9.30 ට අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු ගරු අමාත්‍ය එස්.බී.නාවින්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු ගරු නියෝජ්‍ය අමාත්‍ය පාලිත තෙවරප්පෙරුම මැතිතුමාගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

1877 ජනවාරි 01 දින මහජනයා සඳහා විවෘත කරන ලද කොළඹ ජාතික කෞතුකාගාර ගොඩනැගිල්ලේ සිදු කරන ලද විශාලතම සංරක්ෂණ ව්‍යාපෘතිය වූ මෙය, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ (CECB) උපදේශකත්වයෙන්, ශ්‍රී ලංකා යුධ හමුදා 6 වන ඉංජිනේරු සේවා බලකාය විසින් සිදු කරන ලදී.

එසමේ 2017 පෙබරවාරි 06 දින සිට කොළඹ ජාතික කෞතුකාගාරයේ සියලුම මැදිරි නැරඹීමට මහජනතාවට අවස්ථාව සැලසේ.

{besps}/News/2017/February{/besps}